422 රබන් හා වන්නම් ගායනා කරමින් සතුටු වෙමු.

සැවුලා වන්නම

- මාත්‍රා 2+2ට (සුළු තනි තිතට) අත්තාල තබන්න.
- මාත්‍රා 4+4ට (මහ තනි තිතට) අත්තාල තබන්න.
- අනතුරුව මාත්‍රා 2+4 තාලයට (සුළු මහ දෙතිතට) අත්තාල තබන්න.
- ඒ අනුව තානම ගායනා කරන්න.
- එම තාල රූපයට අනුව කවියෙන් කවිය ගායනා කරන්න.
- නැවත නැවත ගායනා කරන්න.
- කස්තිරුම, සීරුමාරුව අඩව්ව තාල තබමින් කියන්න.
- අන්තර්ජාල පහසුකම් ඇත්නම් තවදුරටත් නිවැරදි නාදමාලාව තහවුරු කරගන්න.
- සැවුලා වන්නමේ තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව කටපාඩම් කරගන්න.
- e නැණ පියස සාමාන්‍ය පාඩම් සටහන් තව දුරටත් ඔබට අධ්‍යනය කළ හැක.

## උඩරට සැවුලා වන්නම

**තාලය** - සුළු මහ (මාත්‍රා 2 + 4) දෙතිත

**බෙර පදය** - දොං දොං ජිං ජිං ගජිගත

**තානම** -
තම් තම්දන තානම් දන තම්දන තානම්
තම් තම්දන තානත් තෙයි තම්ද නා තම්දෙ නා නා

**කවිය** -
සුරිඳුන් පෙර සිටන් බලයුත් සවතිඳුන්
සහගොස් කළ යුදෙන් අසු රන්ජය නොලදින්
බර අත් ගෙන කගින් ඇන කොන්තව් වලින්
අසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්

ගසමින් කග පතින් දෙපලුව අසුර සෙන්
දූරුපා අතළුවෙන් පලු දෙක ගෙන සැනකින්
එම වන් පලුවකින් එ උපන් සැනයකින්
සැවුලා නම එයින් ලොව පළ කළ උපතින්

**කස්තිරම** -
කුඳ ගජිගත /// කුඳ තා
කුඳ ගජිගත /// කුඳ තා
කුඳ ගජිගත කුඳ තා //
කුඳ තා //
කුඳ ගජිගත /// කුඳ තා //

සීරුමාරුව - තකු තක තරිකිට කුංදත්
ගත් ජිත් තක ජිත් කුංදත්
ගත් ජිත් තක ජිත් කුංදත්
තකු තක තරිකිට කුන්දත් දොං තා

අඩව්ව - ජෙන් තත් තත් /// ජෙන් තා - ජෙනු තත් තත් /// ජෙනු තා
ජෙන් තත් තත් ජෙන් තා - ජෙනු තත් තත් ජෙනු තා
ජෙන් තා - ජෙනු තා
දෙහොකඩ තා - දෙහොකඩ ගත කුඳ දෙහොකඩ තා

## 4.2.2 රබන් හා වන්නම් ගායනා කරමින් සතුටු වෙමු.

## සිංහරාජ වන්නම

- ❖ මහතනි තිතට ගැයෙන වන්නමක් බව හඳුනාගන්න.
- ❖ මාත්‍රා 4 + 4 ට අත්තාල තබන්න.
- ❖ අත්තාල තබමින් 4 + 4 බෙරපදය කියන්න.
- ❖ ඒ අනුව තානම ගයන්න.
- ❖ තානම කීප වරක් ගයන්න.
- ❖ අනතුරුව කවිය ගායනා කරන්න.
- ❖ අන්තර්ජාලය පරිශීලනය කරමින් නිවැරදි නාදමාලාව හඳුනාගන්න.
- ❖ ඒ අනුව නිවැරදි අත්තාල තබමින් ගායනා කරන්න.
- ❖ කස්තිරම්, සීරුමාරුව, අඩව්ව තාල තබමින් කියන්න
- ❖ බෙර පදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව කටපාඩම් කරන්න.

## 4.2.2 රබන් හා වන්නම් කවි ගයමින් සතුටු වෙමු

- රබන් කවි ගැමි ගායනාවක් බව හඳුනාගන්න.
- අනෙකුත් ගැමි ගායනා සරළ වුවද රබන් කවි තරමක් සරල බවින් මිදී ඇති බව හඳුනා ගන්න.
- දී ඇති රබන් කවි අතුරින් ඔබ කැමති රබන් ගායනාවක් තෝරා ගන්න.
- ඔබ කැමති ආකාරයට ගායනා කිරීමට උත්සහ කරන්න.

  අන්තර්ජාල පහසුකම් ඇති දරුවන් ඒ මගින් නිවැරදි නාදමාලාවට ගායනය කරන්න.

  අනතුරුව අත්තාල තබමින් ගසන්න.
- e නැණ පියස සාමාන්‍ය පාඩම් සටහන් තව දුරටත් ඔබට අධ්‍යනය කළ හැක.

# රබන් කවි

- නම් උතුන් පෙම්බර ගුණ රුසිරු  රබානා
  දූන් මෙමන් අතින් රැගෙන කරකවමි  මනා
  පෙම් සිතින් බලනු මැනවි දෙනෙත්  පාමිනා
  සන්තොසින් අසනු මැනවි කීම වෙන  වෙනා

- අතකට ගෙන රබන් පොඩිය වයති දිසි  රුවින්
  ගතසිත බඳ සොලවා සිලි සිලි නද  කරමින්
  සිතකටවත් නොගෙන රඟති විදුලිය  විලසින්
  අහසට දමමින් අල්ලා රබාන  දැතින්

ත්‍රිවිධ ඥාන විදුරු පඬි අපෙ මහ ගෞතම නම් මුනිඳු ...........
ඒ බුදු වූ ගෞතම නම් මුනිඳු..........

දෙසු දහම් ඇසුමට ඒ නිමලා - විසු භවය යකුගෙන් තතු දැනලා
නසා ලන්ට කිව් දිවි අසලා බණ - දෙසු විදුර පණ්ඩිතමයි ගෞතම

එදා ඒ ඇතු විදුමට ආ වැදි හට - පුදා ඒ දළ දෙක දීලා දැතට
සදා ඒ බුදු බව පැතු මාතා හට - පුදා වදිමු අපි මල් ගෙන දෝතට

රටකට මව් සමගින් එනැව් නැග යන කල අපෙ  මුණිඳුන්
මකරෙට ගැසු සුළඟින් එනැව බිඳ සමුදුර මැද  ගිලුනෙන්
උරපිට මව් තබමින් සතියක් පීනල ගොඩ  නැගුනෙන්
අටවිසි මුනිඳු බලෙන් අපහට අවසර ලැබෙනු  සබෙන්

සැකසුම : එම්.ඩබ්.ඩී.එස්.එම්.කාන්තිමාලා
නැටුම්(ගුරු උපදේශක)